# ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා

## ජාතික සුපිළිපන් ප්‍රණාම - 2009

## ඩබ්ලිව්.එම්.චන්දන ජයතිස්ස මහතා

ඩබ්.එම්.චන්දන ජයතිස්ස මහතා, රජයට අයත් මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ ප්‍රථම මානව සම්පත් සංවර්ධන කළමණාකාරවරයාය.

ඔහු එම ආයතනය මසකට රුපියල් මිලියන 80 ක තරම් ලාභ ලබන තත්ත්වයකට පත් කිරීම සඳහා අප්‍රතිහත ධෛර්යයකින් යුතුව කටයුතු කළ, මිල්කෝ දූෂණ ඉදිරියේ ඉන්ද්‍රඛීලයක්සේ නැඟී සිටිමින් දූෂණයට එරෙහිව සටන් කළ ආදර්ශමත් රාජ්‍ය සේවකයෙකි.

මහනුවර මැණික්හින්නේ උපතලබා, මැණික්හින්න මහා විද්‍යාලය හා වලල මධ්‍ය මහා විද්‍යාලයෙන් අධ්‍යාපානය හදරන ඔහු ජීවිතයේ අනේක විධ දුක් කම්කටොළු මධ්‍යයේ නිදහස් අධ්‍යාපනයේ මහගු ප්‍රතිඵල අත්පත් කරගනිමින්, පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධියත්, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයෙන් එල්.එල්.බී. උපාධියත් දිනාගැනීමට සමත්වෙයි.

ඔහු අ.පො.ස. (උ.පෙළ) ට ඉගෙන ගනිද්දී පියා ඔත්පල වීම නිසා රැකියා විරහිත සිය මැණියන් සමග බාල සහෝදර සහෝදරියන් තිදෙනෙකුගේ අධ්‍යාපනයේත් කුඩුම්භ සංරක්ෂණයේත් බර කරට ගන්නා ඔහු අ.පො.ස. (උ.පෙළ) හදරන්නේ රාත්‍රී කාලයේ වෘත්තීය මුරකරුවෙකුත් දිවා කාලයේ කුසලතාවලින් පිරිපුන් සිසුවෙකුත් බවට පත්වෙමිනි.

*"තාත්තා ඔත්පල වීමත් එක්ක මට රස්සාවක් නොකර ඉන්න බැරිවුණා. ඒ කාලේ වික්ටෝරියා එක හදපු දිගන විලේජ් එකේ මුරකාරයෙක් විදියට වැඩ කරලා උදේ පාන්දර පයින්ම ගෙදර ඇවිත් ඉස්කෝලේ ගියා. නිවාඩු දවසට අතිරේකව කීයක් හරි සොයාගන්න කුලී වැඩකට ගියා. මොනතරම් කරදර මැද වුණත් මට ඉගෙනගන්න තිබුණේ පුදුම ආසාවක්. ඉස්කෝලේ අඳින්න මට ඇඳුම් තිබුණේ නැහැ. මට මගේම සපත්තු දෙකක් තිබුණේ නෑ. බොහෝ විට මල්ලියි මමයි දෙන්නම ඇන්දේ එකම ඇඳුම්. ඒත් ඊට මුරවැඩ කරන ගමන් පොත් කියවලා කරුණු සොයාගෙන ඉස්කෝලේ විවාද කණ්ඩායමේ විවාද කළා. පිට ඉස්කෝලෙක විවාදයකට යන දවසකට මගේම යාලුවෙකුගේ සුදු කලිසමක් ඉල්ලගෙන ගියේ.*

*දුප්පත්කමින් මිරිකිලා හිටපු නිසා මම ගතකලේ හැංගිච්ච ජීවිතයක්. ඒත් මහනුවර සිල්වෙස්ටර්, ධර්මරාජ වගේ ප්‍රධාන ඉස්කෝල එක්කත් විවාද කරලා අපි දිනනවා. කථික තරග වලදී හැමදම වගේ පළවෙනියා වුණේ මම. ඊට පස්සෙත් යෞවන සම්මාන හොඳම නිවේදන තරගාවලියේ දිස්ත්‍රික් අංශයෙන් ප්‍රථම ස්ථානයත්, සමස්ථ ලංකා තරගයෙන් තෙවැනි ස්ථානයත් මට ලැබුණා. 1984 දී ඒ තරගයට සහභාගි වෙන්න තමයි, ජීවිතයේ ප්‍රථම වතාවට කොළඹ ආවේ"*

සිය කටුක පාසැල් ජීවිතයේ සුන්දර අත්දැකම් සිහිපත් කරමින් ජයතිස්ස මහතා කියයි.

*"මම ඉඳපු දිළිඳු පසුබිමක් එක්ක කොහොමහරි ලොක්කෙක් වීමේ ලොකු ආශාවක් මා තුළ තිබුණා. 'සයිට් එකක' වැඩ කරද්දී වුණත් මම බැලුවේ එතැන එක්කෙනෙක් විතරක් ඉන්න ප්‍රධාන තනතුර දෙසයි. අපේ සයිට් වල ඉංජිනේරුවෝ ගොඩක් හිටියා. ඒත් පිරිස් කළමණාකාරවරු හිටියේ සයිට් එකටම එක්කෙනයි. මගේ ඉලක්කය වුණේ හොඳ ප'සනල් මැනේජර් කෙනෙක් වෙන එක"*

.............................................................................................

ඔහු 2004 වසරේ ' මිල්කෝ ' ආයතනයේ මානව සම්පත් සංවර්ධන කළමණාකාර තනතුරට පත්වන්නේ කම්කරු තනතුරුවල සිට පිරිස් කළමණාකාර තනතුර දක්වා විවිධ ආයතන රැසකින් ඒකරාශිකරගත් තමන්ගේම අත්දැකීම් සම්භාරයක්ද සහිතවය.

පුංචියට පෙනෙන සුළු පරිමාණ දූෂණ මගින් විනාශවන පිරිවැය මහා පරිමාණ දූෂණ මගින් සිදුවන හානියටත් වඩා සමහරවිට වැඩි බව අත්දැකීමෙන් තේරුම් ගන්නා ඔහු එම ගැටලු හඳුනාගනිමින්, පද්ධතිමය වෙනස්කම් ඔස්සේ දූෂණ වැලැක්වීමේ පුරෝගාමී උත්සාහයක නිරතවෙයි. රු. 5/- ක් ඉපයීමට දැරිය යුතු පරිශ්‍රමය අත්දැකීමෙන් දන්නා ඔහු සෑම පුංචි වංචාවක් සම්බන්ධයෙන්ම දැඩි අවධානයක් යොමු කරයි.

ඒ අතර කළමණාකාරිත්වයේ මුදුණත වසාගෙන පැතිරී ඇති විවිධාකාර දූෂණ වැලැක්වීම සඳහා ඔහු මුළු වැර යොදා සටන් කරයි.

එ.ජා.ප., ජ.වි.පෙ. හා පොදු පෙරමුණු වෘත්තීය සමිති ඒකාබද්ධව ගොඩනගන මිල්කෝ සුරැකීමේ ඒකාබද්ධ පෙරමුණේ නිර්මාතෘවරයා වන්නේ ජයතිස්ස මහතාය. ඒ අතර ලොකු - කුඩා බහුතර පිරිසකගේ පූර්ණ සහය ලබාගනිමින් තවත් කර්මාන්තශාලාවක් ඇරඹීමට රුපියල් මිලියන 300 ක සංචිතයක් ඇතිකරගැනීමට ඔහු සමත්වෙයි.

මිල්කෝ සුරැකීමේ ඒකාබද්ධ පෙරමුණේ සහය ඇතිව දූෂණයට එරෙහිව වහා ක්‍රියාත්මකවන ඔහු මිල්කෝ කළමණාකාරීත්වය විසින් සිදුකරමින් සිටි රුපියල් කෝටි ගණනන මූල්‍ය වංචා, ලිංගික වාසි හා බලපෑම් මත උසස්වීම්, ස්ථාන මාරුවීම් සහ වැටුප් වර්ධක පිරිනැමීම, සුදුසුකම් නොමැතිව තනතුරු ලබාදීම්, දේශපාලන ව්‍යාපෘති සඳහා මිල්කෝ ආයතනයේ ලක්ෂ ගණන් වත්කම් විනාශ කර දැමීම්, හා රාජ්‍ය දේපල අයථා පරිහරණය වැනි දූෂණයේ විවිධ ස්වරූපයෙන් හඳුනාගනිමින් තම ශක්ති ප්‍රමාණයෙන් ඊට විසඳුම් සෙවීම සඳහා උපරිම ආකාරයෙන් කැපවෙයි. ඒ හරහා තමන් දන්නා හඳුනන දේශපාලනඥයින්, ජනමාධ්‍යවේදීන්, ජනාධිපති විමර්ශන ඒකකයේ නිලධාරීන්, විෂය විශේෂඥයින් ආදී විවිධ පිරිස් මෙම දූෂණ විරෝධී අරගලයේ කොටස්කරුවන් බවට පත්කරගැනීමට ඔහු සමත් වේ.

වරක් රුපියල් කෝටි 13 කට අධික මිල්කෝ මූල්‍ය වංචා හා අයථා ගණුදෙණු පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාවක් ජනාධිපතිවරයා අතටම පත්කරවන ඔහු එම වංචා පිළිබඳව ජනාධිපති විමර්ශන ඒකකය මගින් පූර්ණ පරීක්ෂනයක් සිදුකරවීමට සමත්වෙයි. එම විමර්ශනයේ ප්‍රතිඵලයක් ලෙස අයථා ගෙවීම් රැසැක් වලක්වාගැනීමටද ප්‍රධාන පෙළේ කිහිපදෙනෙක් ගෙදර යැවීමටද ඔහුට හැකිවෙයි.

ජයතිස්ස මහතාගේ මෙම දූෂණ විරෝධී ක්‍රියාකාරකම් නුරුස්සන දූෂිතයෝ ඔහුට මරණීය තර්ජන එල්ලකරමින්, රාජකාරීමය වශයෙන් ඔහු දැඩි පීඩාවට පත්කරති. අවසානයේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් අනුව ඔහු සේවයෙන් පහකරන බව පවසමින් කළමණාකාරීත්වය ඔහුගේ රැකියාව පවා අහිමි කරන අතර ඔහු ඒ සියල්ලට අභියෝග කරමින් නීතිය ඉදිරියට යයි.

ජීවිත තර්ජන මධ්‍යයේ දූෂණ විරෝධී අරගලයේ යෙදී සිටියදී වරක් දැඩි ප්‍රශ්න සහගත ආකාරයේ, බරපතල දුම්රිය අතුරකට ලක්වීමට ඔහුට සිදුවන අතර එයින් ඔහුගේ ජීවිතය බේරෙන්නේ අනූනමයෙනි.

දූෂණය නිසා රටට අහිමි වීමට ගිය රුපියල් කෝටි ගණනක් ඉතිරිකර දෙමින්, මිල්කෝ ආයතනයෙන් දූෂණය පළවා හැරීමේ අධිෂ්ඨානයෙන් යුතුව පුරෝගාමී මෙහෙවරක යෙදුන චන්දන ජයතිස්ස මහතා, මේ වනවිට නිශ්චිත ආදායම් මාර්ගයක් නොමැතිව, දෙරු පියෙකු වශයෙන් ඉතා දුෂ්කර තත්ත්වයකට පත්ව සිටියද ඔහුගේ දූෂණයට එරෙහි අරගලය තවමත් අත්හැර නැත.